# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 2022/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 25/07/2024
පැය 0800

## මාධ්‍ය නිවේදනය

**අවුරුදු 03 මාස 06 ක දරුවෙකු කෲරත්වයට පත්කල පියෙකු අත්අඩංගුවට - ඇල්පිටිය පොලිස් ස්ථානය.**

2024.07.24 වන දින රාත්‍රී කාලයේ ඇල්පිටිය පොලිස් වසමේ අනුරුද්ධගම කරන්දෙණිය ප්‍රදේශයේ අවුරුදු 03 යි මාස 06 ක පිරිමි දරුවෙකුට කෲර ලෙස සලකන බවට 118 කෙටි පණිවිඩ මධ්‍යස්ථානයෙන් ඇල්පිටිය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර දරුවාගේ පියා ඇල්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන කරන්දෙණිය, අනුරුද්ධගම ප්‍රදේශයේ පදිංචි අරක්කැමිවරයෙකි.**

සැකකරුගේ වයස අවරුදු 24 ක් වන බිරිඳ රැකියාවක් සඳහා විදේශගතව ඇති අතර සැකකරු සහ මෙම දරුවා පමණක් නිවසේ සිටී. සැකකරු විසින් දරුවාගේ අත් ඔසවා බිම දණ ගස්වා දරුවා විසින් ආහාර ඉල්ලා සිටීමේදී පරුෂ වචනයෙන් බැණ වැදී ඇති බවත්, දරුවාගේ එක් පාදයක් පාපැදියක ඉදිරිපස රෝදයට යට කරමින් කෲරත්වයට පත් කර ඇත. මෙම සැකකාර පියා මෙලෙස දරුවා කෲරත්වයට පත්කිරීම් වීඩියෝගත කර විදෙස්ගත දරුවාගේ මවට යොමු කිරීමට කටයුතු කර ඇති බවටත් සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

අදාල වීඩියෝ පටය මේ දිනවල සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සංසරණය වන බවට නිරික්ෂණය වේ. ඇල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**